ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல. / My No. | CSS/7/52 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2015.07. 23 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 05/2015

දකුණු පළාත් සභාවේ,

ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් හා

ගණන් දීමේ නිලධාරින් වෙත.

**<u>ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම.</u>**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2014.07.04 දින නිකුත් කල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වු අතිරේක අංක 28 මගින් භාණ්ඩ, වැඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනයට අදාල කොන්ත්‍රාත් පිරිනැමීම නිර්දේශ / නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන් සංශෝධනය කර ඇත.

එම ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 28 මගින් හඳුන්වාදී ඇති ප්‍රසම්පාදන කමිටු වල අධිකාරී සීමාවන් පදනම් කර ගෙන දකුණු පළාත් සභාවේ දැනට ක්‍රියාත්මක මුදල් රීති සංග්‍රහයේ මුදල් රීති 422 හි සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධනය කිරීමට දකුණු පළාත් ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2015 මැයි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 700 මගින් ලැබී ඇති අතර, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/7/9 හා 2015/07/10 දිනැති ලිපිය මගින් ලැබී ඇත.

එබැවින් පහත සඳහන් ප්‍රසම්පාදන කමිටු සීමා අනුව ඔබ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලෙසත්, මෙහි සඳහන් නියමයන් හා උපදෙස් පිළිපදින ලෙසත්, කාරුණිකව දන්වමි. මේ සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවට අයත් සියළු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දැනුම් දෙමි.



ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம்: / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස් එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

## <u>මුදල් රීති 422 - සංශෝධිත ප්‍රසම්පාදන කමිටු සීමා.</u>

### 422.1.(අ). විවෘත තරඟකාරී ලංසු කැඳවීම / සෘජු කොන්ත්‍රාත් ක්‍රමය

භාණ්ඩ, වැඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටිය (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1, 3.2, හෝ 3.3 ) සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5 හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීම.

| බල අධිකාරිය | ශ්‍රී ලංකා රජය අරමුදල්ගත කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල් ගත කොන්ත්‍රාත්තු |
|---|---|---|
| 1. අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු. මිලියන 200 ට වැඩි හෝ සමාන | රු.මිලියන 300 ට වැඩි හෝ සමාන |
| 2. අමාත්‍ය මණ්ඩලය පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා | රු.මිලියන 200 ට වැඩි හෝ සමාන | රු.මිලියන 300 ට වැඩි හෝ සමාන |
| 3. ප්‍රධාන ලේකම්ගේ ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | රු.මිලියන 200 ට අඩු | රු.මිලියන 300 ට අඩු |
| 4. ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා | රු.මිලියන 200 ට අඩු | රු. මිලියන 300 ට අඩු |
| 5. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ (පළාත් අමාත්‍යාංශ හා නි.ප්‍ර.ලේ ඉංජිනේරු සේවා./සැලසුම්/මුදල්) | රු. මිලියන 50 ට අඩු | විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී දෙපාර්තමේන්තුවක් සෘජුවම වගකියන අවස්ථාවක ව්‍යාපෘති ප්‍රසම්පාදන අධිකාරී සීමා අදාළ වේ. |
| 6. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා (පළාත් අමාත්‍යාංශ හා නි.ප්‍ර.ලේ.ඉංජිනේරු සේවා./සැලසුම්/මුදල්) | රු. මිලියන 50 ට අඩු | |
| 7. ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ | - | රු. මිලියන150 ට අඩු |
| 8. ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා | - | රු.මිලියන 75 ට අඩු |
| 9. පළාත් කාර්යාල ප්‍රසම්පාදන කමිටු | රු. මිලියන 10 ට අඩු | රු. මිලියන 10 ට අඩු |
| 10. ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු | රු. මිලියන 5 ට අඩු | රු. මිලියන 5 ට අඩු |

**422.1.ආ.- භාණ්ඩ , වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීම (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4)**

| බල අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල් සපයන ව්‍යාපෘති | විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති |
|---|---|---|
| 1. ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ ( ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 10 ට අඩු | රු.මිලියන 10 ට අඩු |
| 2. ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 10 ට අඩු | රු.මිලියන 15 ට අඩු |
| 3. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 5ට අඩු | රු.මිලියන 7 ½ ට අඩු |
| 4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා ( ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 5 ට අඩු | රු.මිලියන 7 ½ ට අඩු |
| 5. ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් කටයුතු (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 3 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 2 ට අඩු | රු.මිලියන 2 ට අඩු |
| 6. පළාත් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව - ඉදිකිරීම් වැඩ ( ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.මිලියන 1 ට අඩු | රු.මිලියන 1 ට අඩු |

| | | |
|---|---|---|
| 7. පළාත් කාර්යාල ප්‍රසම්පාදන කමිටුව - සැපයුම් හා සේවා (ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිළ ගණන් 5 ට නොඅඩුව කැඳවීමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරීමෙන්) | රු.ලක්ෂ 5 ට අඩු | රු. ලක්ෂ 5 ට අඩු |
| 8. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- ඉදිකිරීම් වැඩ මුද්‍රා තබන ලද මිළ ගණන් 3ට නොඅඩුව කැඳවීම මගින් ) | රු. ලක්ෂ 5 | - |
| 9. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- සැපයුම් හා සේවා මුද්‍රා තබන ලද මිළ ගණන් 3ට නොඅඩුව කැඳවීම මගින් | රු.ලක්ෂ 5 ට අඩු | |
| 10.ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව( ඉදිකිරීම් වැඩ)<br>ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 5කට නොඅඩුව කැඳවිමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරිමෙන් | රුපියල් ලක්ෂ 5 ට අඩු | |
| 11.ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව( සැපයුම් හා සේවා)<br>ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් 3කට නොඅඩුව කැඳවිමෙන් හා ප්‍රසිද්ධ විවෘත කිරිමෙන් | රු.250,000 ට අඩු | |
| 12.ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව (ඉදිකිරීම් වැඩ)<br>මුද්‍රා තබන ලද මිල ගණන් 3කට නොඅඩුව කැඳවිම මගින් | රු.250,000 ට අඩු | |
| 13.ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව (සැපයුම් හා සේවා)<br>මුද්‍රා තබන ලද මිල ගණන් 3කට නොඅඩුව කැඳවිම මගින් | රු.100,000 ට අඩු | |

**422.1.(ඇ) - සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා, වැඩ, භාණ්ඩ හා සේවා ඍජු මිළදී ගැනීම් (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6)**

| බල අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරි සීමාවන් |
|---|---|---|
| 1. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- ඉදිකිරීම් සඳහා<br>( ඉදිකිරීම් සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කරන විට) | වැඩ<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට | රු. 250,000 ට අඩු |
| 2. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- සැපයුම් හා සේවා සඳහා<br>( සැපයුම් කටයුතු වලදී ඍජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කරන විට) | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා<br>මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන විට | රු.ලක්ෂ 1ට අඩු |
| 3. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- ඍජු කොන්ත්‍රාත් ක්‍රමය(ඉදිකිරීමේදි රු.100,000 සීමාව නොඉක්මවිය යුතුය | වැඩ<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි. / දෙ.ප්‍ර / පළාත් අධ්‍යක්ෂ සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./පළාත් අධ්‍යක්ෂ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙක් වෙත නොපැවරිය යුතුය. | රු.ලක්ෂ 1 දක්වා |

| | | |
|---|---|---|
| 4. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි / දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ- | සෘජුවම වෙළඳ පොළෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා . ප්‍රසම්පාදනය<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/පළාත් අධ්‍යක්ෂ සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි./දෙ.ප්‍ර/පළාත් අධ්‍යක්ෂ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය.<br>බලය වෙනත් අයෙකුට පැවරීම නොකල යුතුය. | රු.50,000 දක්වා |
| 5. දෙපාර්තමේන්තු ප්‍රධානියා / පළාත් අධ්‍යක්ෂ | මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව දෙ.ප්‍ර./පළාත් අධ්‍යක්ෂ සහතික විය යුතුය. මෙම අධිභාරය දෙ.ප්‍ර./ පළාත් අධ්‍යක්ෂ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය.<br>• රු.100,000/- ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා ප්‍ර.ග.නි. ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු.ලක්ෂ 1 දක්වා |

| | | |
|---|---|---|
| 6. දෙපාර්තමේන්තු ප්‍රධානියා තම බලය අංශ ප්‍රධානියාට ලබා දිය හැකිය.<br>. | එක් දිනකදී එක් කටයුත්තක් සඳහා රු.5000/- නොඉක්මවන පරිදි සුළු වටිනාකම්වලින් යුත් උපකරණද ඇතුළු භාණ්ඩ හා සේවා මිළ දී ගැනීම.<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරන එවැනි මිළදී ගැනීම් වල එකතුව රු.20000/- නොඉක්මවිය යුතුය. | රු.5000/- දක්වා |
| 7. ප්‍රාදේශිය ප්‍රාදේශිය(ඉදිකිරිම් වැඩ) තරගකාරී මිල ගණන් කැඳවීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන විට | රු.50,000 ට අඩු | |
| 8. ප්‍රාදේශිය ප්‍රාදේශිය(සැපයුම් හා සේවා) තරගකාරී මිල ගණන් කැඳවීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන විට | රු.25,000 ට අඩු | |

**ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,**

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් :-

1. සහකාර විගණකාධිපති , දකුණු පළාත - දැ.ගැ.ස.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ , ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.
3. ගණකාධිකාරී , ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස.